# ශ්‍රී ලංකාවේ රිය අනතුරු පිළිබඳ අධ්‍යනයක්
# (2006 සිට 2015 දක්වා සහ 2015.01.01 සිට 2016.09.30 දක්වා )

**බී. පී. එස්. පී. කේ. පතිරත්න[1]**

**සංක්ෂේපය**

රිය අනතුරු සමාජයට අවාසිදායක සංසිද්ධියකි. සෘජුවම සිදුවන ජීවිත හානි, අංගවිකල වීම හා දේපළ හානි හැරුණු විට නිෂ්පාදන ධාරිතාවට සිදුවන හානි, අලුත් වැඩියා කිරීම් සඳහා වන වියදම් සහ රක්ෂණ වැය වැනි නොපෙනෙන හානිද සිදුවේ. මෙම හානි නියත වශයෙන්ම රටෙහි ආර්ථිකයට බලපෑම් ඇති කරන බැවින් රිය අනතුරු හා එමගින් සිදුවන හානි අවම කර ගැනීමට උත්සහ කළ යුතුය. රිය අනතුරු සිදුවීමේ ප්‍රවණතාවය පිළිබඳව විශ්ලේෂණය කිරීම මෙන්ම රිය අනතුරු සිදුවීමට ප්‍රධාන හේතුන් හා එම අනතුරු වළක්වා ගැනීම කළ යුතු ආකාරය පිළිබඳව අධ්‍යයනය මෙහි අරමුණ වේ. මෙහිදී ශ්‍රී ලංකා පොලිස් රථවාහන මූලස්ථානයේ වාර්තාවන් ද්වීතීක දත්ත ලෙස භාවිතා කර ඒවා වගු, වට ප්‍රස්තාර ,තීරු ප්‍රස්තාර හා රේඛීය සටහන් මගින් ඉදිරිපත් කර ඇති අතර මාරක අනතුරු වලට උදාහරණ ලෙස ඡායාරූප කිහිපයක් ද දක්වා ඇත. දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව 2006 සිට 2015 දක්වා වසර දහයක කාලයක් තුළ රිය අනතුරුවලින් මියගිය ගණන මුළු අනතුරුවලින් 7% පමණ වන බව ගණනය කළ හැක. එසේම සලකා බැලු 2015.01.01 සිට 2016.09.30 දක්වා කාලය තුළ සිදු වු මාරක අනතුරු වලට වැඩි වශයෙන් වගකිව යුතු වන්නේ මෝටර් යතුරුපැදි වන අතර එය මුළු අනතුරුවලින් 40% පමණ වේ. එසේම එම රිය අනතුරුවලින් මියගිය මගීන්ගෙන් 70% පමණ පුරුෂයින් වේ. මාරක රිය අනතුරු සිදුවීමට තුඩු දෙන හේතුන් අතුරින් ප්‍රධාන හේතුව වන්නේ, අපරීක්ෂාකාරි හා නොවිමසිලිමත් ලෙස රිය පැදවීම වන අතර 52% මාරක අනතුරු මේ හේතුවෙනුත් 5% බීමතින් රිය පැදවීම නිසා සිදු වී ඇත. මෙලෙස ශ්‍රී ලංකාව තුළ වසර දහයක කාලයක් තුළ සිදු වී ඇති වාර්තා වු රිය අනතුරු ගණන දළ වශයෙන් 360,704 පමණ වන බව වාර්තා වන අතර ජීවිත හානි හා දේපළ හානි ද විශාල ප්‍රමාණයක් වේ. රථවාහන නීති රීති වලට අනුව පරික්ෂාකාරි හා විමසිලිමත් ලෙස බීමතින් තොරව රිය පැදවීමෙන් හා සැලකිලිමත් ලෙස මාර්ගයේ ගමන් කිරීමෙන් රිය අනතුරු වලක්වා ගැනීම කාලීන අවශ්‍යතාවක් මෙන්ම අනිවාර්ය කටයුත්තකි.

**මුඛ්‍ය පද :** රිය අනතුරු, මාරක අනතුරු, ජීවිත හානි

[1] ආර්ථිකවිද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sajanipathirathna.9494@gmail.com